GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2013/12/12

## මාධ්‍ය නිවේදනයයි

### කිරි පිටි හිඟ වීම ළමා සහ වැඩිහිටියන්ගේ සෞඛ්‍යට ආශිර්වාදයකි.

දැනට මාස කිහිපයක සිට කිරි පිටි සමාගම් කිහිපයක් සිය මිල ඉහල නැංවීම සඳහා පාරිභෝගික අධිකාරියෙන් අවසර ඉල්ලා ඇති බවට  වාර්තා පල වුනි. ඒ සඳහා පාරිභෝගික අවසර ලැබී නැති අතර රට පුරා කිරි පිටි හිඟයක් පවතින බවට දැන් දින කිහිපයක සිට සමහරක් මාධ්‍ය වල වාර්තා පල වෙමින් පවතියි.

ස්වභාවික කිරි පෝෂ්‍යදායි ආහාරයක් බව සැබෑවකි. නමුත් කිරි පෝෂණමය වශයෙන් අත්‍යාවශය ආහාර ද්‍රව්‍යක් නොවේ. "කිරි පිටි" ලෙස වෙලඳපොලේ පවතින්නේ ස්වාභාවික කිරි පිටි වලට බොහෝ සෙයින් වෙනස් දෙයක් බව මහජනතාවට තවදුරටත් රහසක් නොවේ. මෙයට මාස කිහිපයකට පෙර උද්ගතවූ DCD අර්බුදයේදී දියර කිරි භාවිතයේ ඇති වැදගත්කම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංමය අවධාරණය කරන ලදි. කිරි සහ ආහාර සුරක්ෂිත තාවය පිලිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ දස වැදෑරුම් යෝජනාවලියේද ඒ බව සඳහන් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අද වන රටේ ජනතාව කිරි පිටි භාවිතයෙන් ඈත්වී දියර කිරි භාවිතයට හුරු වෙමින් සිටිති.

ලෝකයේ දියුණු යැයි සම්මත රටවල ජනතාව භාවිතා කරන්නේද දියර කිරිය. එබැවින් ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේදී කිරි පිටි අත හැර දියර කිරි වලට හුරු වීම යහපත් ප්‍රවනතාවකි.

එබැවින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ප්‍රාර්ථනාව වන්නේ "රට තුල පිටි කිරි තව තවත් හිඟ වේවා! " යන්නය.

මේ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ සෞඛ්‍ය ලේකම්වරයා අතර පසුගියදා පැවති සාකච්ඡාවේදී, රජයේ රෝහල් තුල දියර කිරි ප්‍රවර්ධනය සඳහා වැඩ පිලිවෙලක් සකස් කිරීමට පෝෂණ ඒකකය භාර අධ්‍යක්ෂවරයාට පවරන ලදි. එම අධ්‍යක්ෂවරයා විසින් දේශිය දියර කිරි භාවිතය දිරි ගන්වමින් සකස් කොට ඇති මේ චක්‍ර ලේඛය, සෞඛ්‍ය ලේකම්වරයාගේ අත්සනට යැවීමට පෙර එහි අඩංගු කරුණු සංශෝධනය කිරීමට අමාත්‍යාංශය තුලම සමහර නිලධාරීන් බලවත් උත්සහයක් ගන්නා බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට වාර්තා වී ඇත. බහු ජාතික කිරි පිටි සමාගම් ආරක්ෂා කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ සමහර නිලධාරීන් මේතරම් වෙහෙස වන්නේ කුමන හේතුවක් නිසාද යන්න ගැටළුවකි. මෙය බහු ජාතික කෘෂි රසායන සමාගම් ආරක්ෂා කිරීමට කෘෂි කර්ම අමාත්‍යාංශයේ සමහරක් නිලධාරීන් දරන නින්දිත උත්සහයට බොහෝ සෙයින් සමානය.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර - වෛද්‍ය නවීන් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516